# ඉස්ලාම් සංස්කෘතියේ ඇති සන්නිවේදනාර්ථ (ඉස්ලාමීය විවාහයේ පවතින සන්නිවේදන ලක්ෂණ පිළිබඳ අධ්‍යයනයකි.)

**එම්. එම්. එස්. සාබීර්[1] , එස්.ඒ. ෆාතිමා ශානාස්[2]**

ඉස්ලාම් ආගම සහ ඉස්ලාමීය සංස්කෘතිය යනු එකිනෙකට බද්ධ වී පැවතෙන්නකි. බොහෝ පිරිසක් ඉස්ලාම්හි මූලික ව්‍යුහය යනු අනිවාර්යයෙන් ඉටුකළ යුතු ප්‍රධාන කරුණු පහ පමණකැයි විශ්වාස කරති. නමුත්, ඉස්ලාම් සංස්කෘතියේ සියලු අංග සඳහා නිශ්චිත වූ නීති මූලයන් පවති. ඒවා අනිවාර්යයෙන් ඉෂ්ට කිරීම ඉස්ලාම් භක්තිකයෙකුගේ යුතුකමක් වේ. ජීවිතයේ විශේෂ අවස්ථා සහ එදිනෙදා ජීවිතය සඳහා ද ඉස්ලාම් භක්තිකයකු විසින් පිළිපැදිය යුතු අත්‍යවශ්‍ය කාරණා පවති. විවාහය සඳහා ද එවැනි වූ අනිවාර්ය නීති සහ පොදු ක්‍රියාවලියක් වේ. එමඟින් මිනිසාගේ ස්වභාවික උවමනාවන් *(human needs)* උල්ලංඝනය වේ ද? එයින් සන්නිවේදනය වන අර්ථයන් මොනවා ද? යන්න සොයා බැලීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ.

මෙහිදී ප්‍රාථමික දත්ත ලෙස සහභාගීත්ව නිරීක්ෂණ ක්‍රමය සහ ඉස්ලාම් ධර්මය පිළිබද විශේෂඥයින් තිදෙනකු සමඟ කරනු ලැබූ සම්මුඛ සාකච්ඡා ද, ද්විතීයික දත්ත ලෙස ඉස්ලාම් ධර්මය හා විවාහය සම්බන්ධ ග්‍රන්ථ, ලිපි පරිශීලනය මඟින් ද, දත්ත විශ්ලේෂණය කෙරේ.

ඉස්ලාම් සංස්කෘතියේ විවාහය යන්න යෙදෙනුයේ "නිකාහ්" *(Nikah)* ලෙසයි. එහි සාහිත්‍යමය අර්ථය වනුයේ ‘ලිංගිකමය සහභාගීත්වය’ *(sexual intercourse)* යන්නයි. එනම්, විවාහය යනු මූලිකවම ලිංගික කාරණාවන් මුල් කර ගත්තක් වන අතර ඒ සඳහා පවුල යන ඒකකයේ වැදගත්කම ද ඉස්ලාම් සංස්කෘතිය පෙන්වා දෙයි. ඉස්ලාමීය විවාහයේ උත්සවය, චාරිත්‍ර, ලිංගික කටයුතු, යුතුකම් මෙන්ම දික්කසාදය වැනි සියලු අංග පිළිබදව නිශ්චිත වත්පිළිවෙත් ඇති අතර ඒ සෑම අංගයක්ම

[1] අරාබි හා ඉස්ලාමීය සංස්කෘතික අධ්‍යනාංශය , කොළඹ විශ්වවිද්‍යාලය
ඊමේල්: mmmsucl@yahoo.com

[2] ජනමාධ්‍ය අංශය , කොළඹ විශ්වවිද්‍යාලය
ඊමේල්: fanaafilms@yahoo.com

ඉස්ලාමීය සංස්කෘතිය සමඟ බද්ධ වී ඇති ආකාරයත් එයින් පිළිබිඹු වන අර්ථ පැහැදිලිව හඳුනාගැනීමත් මෙම අධ්‍යයනයේ මුඛ්‍යාර්ථය වේ.

**ප්‍රමුඛ පද:** *ඉස්ලාම් සංස්කෘතිය, සන්නිවේදනාර්ථ, විවාහය*
**Title:** Mass media elements in Islamic culture
**Keywords:** Islamic culture, communications, marriage